දරුවන් උදෙසා
බයිබලයක්

# ජාකොබ්
# නම්
# රැවටිලිකාරයා



ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: M. Maillot; Lazarus Alastair Paterson

සකස්කරන්නා: M. Kerr; Sarah S.

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2023 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.


දෙවියන් වහන්සේ යම්
දවසක ඔබේ පවුලට
කුඩා බිළිඳෙකු එවා
තිබේද? මොනතරම්
ප්‍රීති ජනකද? ඊසාක්
සහ රෙබෙකාගේ
සන්තෝෂය
දෙගුණයකින් වැඩි
වන්නට ඇත. දෙවියන්
වහන්සේ ඔවුන්ට නිවුන්
දරුවන්
දෙදෙනෙකු
දෙන්නට
යන සේක!

බිලිඳුන් දෙදෙනා
රෙබෙකාගේ කුස තුල
දඟලන්නට වූවෝය.
ඇය යාච්ඥා
කරද්දී දරුවන්
දෙදෙනාගෙන්
ජාතීන් දෙකක්
තැනෙන බවත්,
බාල දරුවා වඩාත්
බලවත් වන බවත්
දෙවියන් වහන්සේ
පැවසූ සේක.
සාමාන්‍යයෙන්
සිදුවන්නේ වැඩිමලා
ශ්‍රේෂ්ඨ වීමයි. දරුවන්
දෙදෙනා ඉපදුනෝය.



නිවුන් දරුවන් එක සමාන නොවූහ. වැඩිමහල් දරුවා,
ඒසව් ගේ ශරීරය රෝම වලින් පිරී තිබුණි. ඔහු
වයසින් වැඩෙද්දී දක්ෂ දඩයක්කරුවෙකු වූයේය.
ජාකොබ් ගේ සම සිනිඳු විය. ඔහු ප්‍රිය කළේ
නිවසේ හිඳිමින් වැඩපල කිරීමටයි. පිය වූ ඊසාක්
ඒසව් හට වැඩියෙන් ආදරය කළේය. ඔවුන්ගේ
මවගේ ආදරය හිමිවූයේ ජාකොබ් හටයි.



එක් දවසක් ඒසව් හට බඩගිනි විය. “මට කෑමට යමක් දෙන්නයැ” යි ඔහු ජාකොබ් ට කීය. “එසේනම් ඔබේ වැඩිමහල් බවේ අයිතිය මට විකුණන්නයැ” යි ජාකොබ් පැවසීය. පවුලක උපදින වැඩිමහල් දරුවාට දෙවියන් වහන්සේ දුන් පොරොන්දු ගැන ඒසව් තැකීමක් නොකළේය. ඔහු ජාකොබ්ගේ ඉල්ලීමට එකඟ වූයේය. දැන් පටන් ඔවුන්ගේ පියා මියගිය දවසක පවුලේ නායකත්වය ලැබෙන්නේ ජාකොබ් ටය.



එක් රාත්‍රියක දෙවියන් වහන්සේ ඊසාක්ට කතා කරමින් මෙසේ කී සේක. “මම ඔබේ පියවූ ආබ්‍රහම්ගේ දෙවියන් වහන්සේය. මම ඔබ සමඟ සිටිමි. මම නුඹේ පරම්පරාවට ආශීර්වාද කරන්නෙමි.”



ඊසාක් දෙවියන් වහන්සේ ට නමස්කාර කළ නමුත්, ඔහුගේ
පුත් ඒසව් දෙවියන්වන්සේ ගැන සැලකිල්ලක් නොදැක්වූ
හිත්තීය ජාතික කාන්තාවන් දෙදෙනෙකු සරණපාවා
ගත්තේය.





ඊසාක් මහලු වයසට පැමිණුනේය. ඔහු ඒසව් ට කතා කරමින් “මට නැවුම් මස් ගෙනෙන්න. එවිට මම නුඹට ආශීර්වාද කරන්නෙමි” යි පැවසීය. මෙය පවුලේ මුලින් උපදින දරුවාට පියා විසින් පිරිනමන විශේෂ ආශීර්වාදයකි. ඒසව් ඉක්මනින් සතෙකු දඩයම් කරනු පිණිස පිටව ගියේය. මේ කතා කළ දේවල් රෙබෙකා හට ඇසිනි. ඒ ආශීර්වාදය ජාකොබ් හට ලබාදෙන්නට ඇයට අවශ්‍ය විය.



රෙබෙකාට සැලැස්මක් තිබුනි. ඇය ඊසාක් කැමති කෑම ඉක්මණින් පිළියෙළ කරන අතරතුර ජාකොබ්, ඒසව් ගේ ඇඳුම් ඇඳගෙන ලොම් සහිත සතෙකුගේ හම් අත්වලත් බෙල්ලෙත් පටලවා ගත්තේය. ඊසාක්ගේ ඇස් පෙනීම අඩුවී තිබුණි. සමහරවිට ඔවුන්ට ඔහුව රවටන්නට හැකි වන්නේය.

ජාකොබ් ඊසාක් වෙත කෑම
රැගෙන ආවේය. “ඔබේ
කටහඬ ජාකොබ්ගේ
වගෙයි, නමුත් ඔබේ අත්
ඒසව් ගේ වගේයැ” යි ඊසාක්
කීවේය. කෑම කෑ පසු
ඊසාක් තමා ඉදිරිපිට
දණගසා සිටින පුත්‍රයා හට
ආශීර්වාද කළේය.





ජාකොබ් පිටව ගිය වහාම ඒසව් ඊසාක් වෙත පැමිණියේය. “මෙන්න ඔබගේ කෑමයැ” යි ඔහු කීවේය. ඊසාක්, තමුන් රැවටුණු බව තේරුම් ගත්තේය. “මට මා දුන් ආශිර්වාදය නැවත වෙනස් කළ නොහැකියැ” යි කියමින් ඔහු හැඬුවේය. ඒසව් ගේ සිත වෛරයෙන් පිරුණේය. ඔහු ජාකොබ් මරන්නට තීරණය කළේය.



ඒසව් කළ තර්ජන
රෙබෙකා හට ඇසුනි.
“ඔබේ සහෝද්රයාට ඔබ
කළ දේ අමතක වනතුරු
මාමාගේ ගෙදරට
යන්නයැ” යි ඇය
ජාකොබ්ට කීවාය.


එදා රාත්‍රියේ ජාකොබ්
නිදාගන්නා පිණිස තැනක
නැවතුනේය. ඔහු එතැන
තිබූ ගලක් කොට්ටයක්
මෙන් පාවිච්චි කරමින්
නිදාගත්තේය. සමහරවිට ඔහු
තනියෙන් සිටි නිසා බියෙන් සිටියා
විය හැක. නමුත් ඔහු
සිටියේ තනියෙන්
නොවේ. දෙවියන්
වහන්සේ ඔහුට
අපූරු
හීනයකින්
කතා කළ
සේක.



“මම ඔබේ පියවරුන්ගේ එනම් ආබ්‍රහම් හා
ඊසාක් ගේ දෙවියන් වහන්සේය. මම ඔබ සමඟ
සිටිමි. මම නුඹට මේ දේශය දෙන්නෙමි. ඔබේ පවුල
තුළින් මුළු ලෝකයේම පවුල් ආශීර්වාද ලබන්නෝය”
දෙවියන් වහන්සේ කතා කළ පසු ජාකොබ් අවදි
විය. ඔහු බිය වූයේය.



ජාකොබ් ගේ මාමා වූ ලාබාන් ඔහුව
පිළිගත්තේය. ජාකොබ් ඔහුගේ
ඥාති සහෝදරිය වූ රාබෙල් හට
ආදරය වී, ඇයව විවාහ
කරගන්නා පිණිස ලාබාන්
හට අවුරුදු හතක්
සේවය කළේය.

නමුත් විවාහ
මංගල්‍ය දවසේ රෑ
ලාබාන්, ජාකොබ් රැවටීය.

“මේ ලෙයා මිසක් රාබෙල් නොවේ. ඔබ මා රැවටුවේයැ” යි ජාකොබ් පැමිණිලි කළේය. “වැඩිමහල් දුව මුලින් විවාහ විය යුතුය. දැන් රාබෙල්වද විවාහ කරගෙන මට තවත් අවරුදු හතක් සේවය කරන්නයැ” යි ලාබාන් කීවේය. ජාකොබ් එකඟ විය. සමහරවිට ඔහුද ඊසාක් සහ ඒසව් රැවටූ ආකාරය ඔහුටම මතක් වන්නට ඇත.



ජාකොබ් හට දරුවන් එකොළහක්
වූවෝය. වසර ගණන් ගතවන විට
ඔහු තම පවුල නැවත කානාන්
වෙත රැගෙන යාමට ආශාවෙන්
සිටියේය. ඔහුගේ මව්පියන් සිටියේ
එහිය. එලෙසින්ම ඔහුව මරන්නට
දිවුරුම් දී සිටි ඒසව්ද එහි වූයේය.
එහි යෑම ආරක්ෂිතද?



එය පුදුමාකාර ගමනක් විය. ඒසව් මිනිසුන් හාරසීයක් සමඟ ජාකොබ් හමුවන්නට ආවේය. නමුත් ඔහු ජාකොබ්ට පීඩා කළේ නැත. ඔහු ජාකොබ් වෙත දුවගොස් ඔහුව තදින් වැළඳ ගත්තේය. ජාකොබ් සහ ඒසව් නැවත මිතුරු වූහ. ජාකොබ් ආරක්ෂිතව ගෙදර ආවේය.



ජාකොබ් නම් රැවටිලිකාරයා

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

උත්පත්ති 25-33

**“ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ”**
**ගීතාවලිය** 119:130

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහෝ සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැගිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත.
ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)